# මෘද් භාජන නිර්මාණයඃ අනුරාධපුර කුඩාකැලෑගම කුඹල් කර්මාන්තය ආශ්‍රිතව සිදු කරන ලද අධ්‍යයනයක්

එච්.එම්.එස්.කේ. හේරත්[61]

''මැටි බඳුන ''මානව පරිණාමයේ විශිෂ්ඨ සංස්කෘතික අංගයක් ලෙස දැක්විය හැකි ය. මැටි අමු ද්‍රව්‍ය ලෙස පදනම් කර ගෙන යම්කිසි ක්‍රියා පිළිවෙලකට අනුව නිර්මාණාත්මකව හැඩ ගැසූ මැටි මෙවලම්, මැටි බඳුන් ලෙස හඳුන්වනු ලැබේ. එය මානව අතීතයේ ආරම්භයේ සිටම පැවති ප්‍රගුණ කරන ලද කර්මාන්තයක්, කලාවක් වශයෙන් ද හැදින්වීමට පුළුවන. සාම්ප්‍රදායික මැටි බඳුන් කර්මාන්තය පදනම් කර ගත් පාරම්පරික ශිල්පින් වාසය කරන ඓතිහාසික පසුබිමක් ඇති අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගලෙන්බිදුනුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කුඩාකැළෑගම ග්‍රාමය පදනම් කරගෙන මෘද් ශිල්පීය තාක්‍ෂණය, අමුද්‍රව්‍ය, හැඩ ගැන්වීම සහ ව්‍යුහ විද්‍යාව පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. වර්තමානය තුළ මැටි බඳුන් නිෂ්පාදන ක්‍රියාවලිය සහ සාම්ප්‍රදායික ශිල්පීය ක්‍රමවේදය හා සසදමින් මානව ඉතිහාසය අනාවරණය කරගත හැකි ප්‍රබලතම මාධ්‍යයක් වන මැටි බඳුන් වල නිෂ්පාදන ක්‍රියාවලිය සහ සාම්ප්‍රදායික ශිල්පීය ක්‍රමවේද කෙසේ වන්නට ඇද්ද යන්න මින් අධ්‍යයනය වේ. මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී එම ශිල්පීන් හා එක්ව සාකච්ඡා කරන අතරම බඳුන් නිර්මාණය කිරීම පිළිබඳව ප්‍රයෝගික අද්දැකීම් පාදක කර ගන්නා ලදී. විවිධ ප්‍රගුණ කිරීම් සහ අත්හදා බැලිම් පදනම් කර ගෙන මානව වර්ගයා විසින් බිහි කරන ලද නිර්මාණ මිනිස් සංකල්ප කැටි කරගත් ඒවාය. මේ නිසා එම නිර්මාණ කලාත්මක අංගයන් ලෙස ද සැලකිය හැකිය. මැටි බඳුන් නිර්මාණය ද එබඳු මානව සංකල්ප කැටි කරගත් කලා මාධ්‍යයකි. මැටි බඳුන් කලාවේ ප්‍රාරම්භක අවස්ථාව කෙබඳු වුවක් යන්න නිශ්චිතවම දැක්වීම අපහසු වුවත් එය මිනිස් හස්තයේ ක්‍රියා කාරීත්වය මත පදනම්ව අනායාසයෙන් සිදු වුවක් බව පෙනේ. නූතනයේ දී මැටි බඳුන් නිර්මාණය උදෙසා භාවිත නිෂ්පාදන ක්‍රියාවලීන් හා ශිල්පීය ක්‍රමවේදයන් මානව පරිණාමයේ විවිධ අවධින්හි අත්හදා බලමින් ප්‍රගුණ කරන ලද ශිල්පීය ක්‍රමවේදයන්ගේ දියුණු අවස්ථාවක් බව නිගමනය කළ හැකි වේ.

ප්‍රමුඛ පදඃ පරිණාමය ආරම්භය,තාක්‍ෂණය ශිල්පීය විධි,ව්‍යුහවිද්‍යාව හැඩගැන්වීම

[61] පුරාවිද්‍යා හා උරුම කළමණාකරණය අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, hmsumuduherath@gmail.com.